# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112784846
isurupaya@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/03/40/02/04//02- (2020) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2020 - 07- 28

සියළුම අතිරේක ලේකම්වරුන්,
විභාග කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන වැඩසටහන.**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුව එම සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනය හෝ අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගත් වෙනත් ආයතනයන් මගින් පවත්වන අධ්‍යාපන කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කළ යුතු වේ.

මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සඳහා (2009 වසරේ සේවයට එක් වූ) සමාන්තර ධාරිතා සංවර්ධන වැඩසටහන් පෙළක් පැවැත්වීමට මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන ශාඛාව මගින් කටයුතු යොදා ඇත. එම වැඩසටහන් පහත පරිදි පැවැත්වීමට කටයුතු යොදා ඇත.

දිනය - වැඩසටහන - 01) 2020/08/24 - 2020/08/27
වැඩසටහන - 02) 2020/09/02 – 2020/09/05
වැඩසටහන - 03) 2020/09/07 – 2020/09/10

ස්ථානය - අධ්‍යාපන සංවර්ධන හා නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය, මීපේ

මෙම වැඩසටහන සඳහා සහභාගී වීමට අපේක්ෂා කරන 2009 වසරේ ශ්‍රී.ල.අ.ප.සේවය සඳහා බඳවා ගෙන ඇති, ඔබ ආයතනයේ/පළාතේ සේවය කරන නිලධාරීන්ගේ නාම ලේඛනය පහත ආකෘතිය අනුව සකස් කර 2020/08/10 හෝ ඊට පෙර hrd.moe@yahoo.com යන විද්‍යුත් තැපැල වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි. (ජාතික පාසල්ද ඇතුලුව)

| නිලධාරියාගේ නම | තනතුර | රාජකාරි ලිපිනය | දුරකථන අංකය | සහභාගී වන වැඩසටහන(1,2,3) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

මෙම ධාරිතා සංවර්ධන වැඩසටහනට සහභාගී නොවීම හේතුවෙන් ඒ සඳහා වෙනත් පුහුණු වැඩසටහනක අවස්ථාවක් ලබා දීමට නොහැකි බව ද, නියමිත ධාරිතා සංවර්ධන වැඩසටහන සම්පූර්ණ නොකිරීම එම නිලධාරීන්ගේ 1 ශ්‍රේණියට උසස්වීම කෙරෙහි සෘජුවම බලපෑ හැකි බව ද එම නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

දෙමළ මාධ්‍ය නිලධාරීන් (3) වැඩසටහන සඳහා ඇතුලත් කරන මෙන්ද දන්වමි.

සී.එම්.පී.ජේ.තිලකරත්න
අධ්‍යාපන අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන)
අධ්‍යාපන ලේකම් වෙනුවට.